


මාලබේ නව ගොඩනැගිලි සංකීර්ණය

## නව ලොවට පෙළ ගැස්මක් සපයන

# තොරතුරු තාක්ෂණ ආයතනය


ශීඝ්‍රයෙන් වර්ධනය වන තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට අවශ්‍ය විද්වතුන් සැපයීමට රටට ලොකු ගැටලුවක් ව පැවතිණි. එමෙන්ම ඒ ක්ෂේත්‍රයට පිවිසෙන්නට බලා සිටින තරුණ පරපුරට මග පෙන්වීමට ආයතනයක් ද නොවී ය. දැන් හිස්තැන පිරවීමට ආයතනයක් බිහිව තිබේ. ඒ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයයි.



මහාචාර්ය
සෑම් කරුණාරත්න
සභාපති



ආචාර්ය ලලිත් ගමගේ
කළමණාකාර
අධ්‍යක්ෂ



පරාක්‍රම විජේසූරිය
අධ්‍යක්ෂ
ව්‍යාපෘති

ශීඝ්‍රයෙන් වර්ධනය වන තොරතුරු ක්ෂේත්‍රයට අවශ්‍ය තාක්ෂණවේදීන් සැපයීම සඳහා ශ්‍රී ලංකා රජය මේ ආයතනය උපාධි පිරිනැමීමේ ආයතනයක් ලෙස ස්ථාපනය කළේ 1999 දී ය.

දැනට මේ ආයතනය පිහිටා තිබෙන්නේ කොළඹ 3 කොල්ලුපිටියේ ලංකා බැංකු මර්චන්ට් ගොඩනැගිල්ලේ ය. කොල්ලුපිටිය මංසන්ධියට නුදුරුව සෑම දිශාවකටම දිවෙන පොදු ප්‍රවාහන පහසුකම් ඇති මධ්‍යස්ථානයක මේ ගොඩනැගිල්ල පිහිටා තිබේ. ප්‍රවාහන පහසුකම් සේම මේ ආයතනය අවට ඇති සිත් අලවන සොඳුරු පරිසරය ද ශාස්ත්‍රෝද්ග්‍රහණයේ යෙදෙන්නන්ට බෙහෙවින් හිතකර ය.

මේ ගොඩනැගිල්ලට බටහිරින් සුවිසල් ලෙස පැතිරී ඇති ඉන්දීය සාගරයේ නීලවර්ණ ජලස්කන්ධය ද නැගෙනහිරින් ඈත කඳුකරයේ මිදුම්න් නැහැවුණ කඳුවැටිය ද, කොළඹ නගරයේ අහස සිඹිමින් නැගී සිටිනා උත්තුංග ගොඩනැගිලිවල ශිඛර තීරය ද මනස්කාන්ත දර්ශනයක් මවයි.

මෙම ආයතන පිහිටා ඇත්තේ වායුසමනය කර ඇති කාමර හා පර්යේෂණාගාර, ස්වයංක්‍රිය සෝපාන, ස්වයංක්‍රිය ගිනි නිරීක්ෂණ හා පාලන ක්‍රම හා රූපවාහිනී කැමරා ආදිය ඇතුළත් ගොඩනැගිල්ලක වන අතර එය අධ්‍යාපන කටයුතු සඳහා හිතකර පරිසරයක් ලබා දෙයි.

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය විසින් දැනට විද්‍යාවේදී උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා පවත්වාගෙන යයි. තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී උපාධිය සැලසුම් කර ඇත්තේ ශිෂ්‍යයාගේ අභිමතය පරිදි සහතික පත්‍රයක් හෝ ඩිප්ලෝමාවක් ලබාගෙන

පාඨමාලාවෙන් බැහැරවීමේ හෝ උපාධිය දක්වා අඛණ්ඩව අධ්‍යයන කටයුතු කිරීමේ හෝ ඉඩ ප්‍රස්ථා ලැබෙන පරිදි ය. රැකියා නියුක්තිය ආදි හේතු නිසා විවිධ ස්ථරයන්හිදී පාඨමාලාවෙන් බැහැර වෙන ශිෂ්‍යයන්ට නැවත පාඨමාලාවේ අදාළ ස්ථරයකට ඇතුළත් වී උපාධිය දක්වා අධ්‍යයන කටයුතු කළ හැකි ය.


ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ මණ්ඩප කීපයක් ඇති අතර ප්‍රධාන මණ්ඩපය පිහිටා ඇත්තේ මාලබේ නගරයේ අක්කර 25 ක භූමිභාගයක වූ සුන්දර පරිසරයක මේ මණ්ඩපය තැනීම සඳහා වැය කර ඇති මුදල රු. මිලියන 336 කට අධික ය.

අනෙක් මණ්ඩපය පිහිටා ඇත්තේ කඹුරුපිටියේ ය. 2002 වසරේ දී සිසුන් 1000 ක් පමණ ඇතුළත් කර ගනු ලබන අතර ඉන් 875 මාලබේ මණ්ඩපයට ද ඉතිරි කොටස කඹුරුපිටියට ද යොමු කෙරේ.

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ සභාපතිවරයා වන්නේ මහාචාර්ය එස් කරුණාරත්න ය. මෙහි කළමනාකාර අධ්‍යක්ෂධූරය හා ප්‍රධාන විධායක ධූරය උසුලන්නේ ආචාර්ය ලලිත් ගමගේ ය. ලලිත් ගමගේ මොරටුව සරසවියේ පරිගණක සේවා මධ්‍යස්ධානයේ හිටපු අධ්‍යක්ෂවරයා ය.

ආයතනයේ අරමුණු ගැන ඔහු විස්තර කරමින් මෙසේ පැවසීය.

තොරතුරු තාක්ෂණ ආයතනයක් අපට බිහිකිරීමට සිදුවූවේ රටට ඉතාමත් වුවමනා තොරතුරු තාක්ෂණවේදීන් බිහිකිරීමටයි. දැනට අවුරුදු 3 කට කලින් අපේ රටේ සියලුම උසස් අධ්‍යාපන ආයතනවලින් බිහි කළ තොරතුරු තාක්ෂණවේදීන් 350 ක් පමණයි හිටියෙ. එම වකවානුවේදී මේ රටට තොරතුරු තාක්ෂණවේදීන් 1500 ක් පමණ අවශ්‍ය වී තිබුණා. මේ හේතුව නිසා මේ රටේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය දියුණු කිරීමටත් ඊට අවශ්‍ය ආයෝජන ආකර්ෂණය කිරීමට අපට අපහසු වුණා. සමහර ව්‍යාපාර ඉන්දියාවෙන් මේ තාක්ෂණයත් ගෙන්වා ගත්තා.



පිළිගැනීමේ අංශය

මේ තත්ත්වය දිගින් දිගටම පැවතීම අවාසියක් බව අපට වැටහුණා. එනිසයි මේ වගේ ආයතනයක් බිහිකළේ. තොරතුරු තාක්ෂණ අධ්‍යාපන පහසුකම් සලසාදීම මෙන්ම තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රවීනයන්ගේ සංචිතයක් ඇතිකරීමද මේ ආයතනයේ අරමුණකි.

දැනට අවුරුදු 3 කට කලින් අපේ රටේ සියලුම උසස් අධ්‍යාපන ආයතනවලින් බිහි කළ තොරතුරු තාක්ෂණවේදීන් 350 ක් පමණයි හිටියෙ. එම වකවානුවේදී මේ රටට තොරතුරු තාක්ෂණවේදීන් 1500 ක් පමණ අවශ්‍ය වී තිබුණා. මේ හේතුව නිසා මේ රටේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය දියුණු කිරීමටත් ඊට අවශ්‍ය ආයෝජන ආකර්ෂණය කිරීමට අපට අපහසු වුණා.

මෘදුකාංග නිෂ්පාදන මධ්‍යස්ථානයක් පිහිටුවීම තවත් අරමුණකි. දැනටමත් මේ ආයතනය තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ මෘදුකාංග නිෂ්පාදන ඇණවුම් රැසක් බාරගෙන තිබේ.

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය ශ්‍රී ලංකාවේ තොරතුර කර්මාන්තය සමග ප්‍රබල සබඳතා පවත්වයි.

නිදසුනක් දක්වුවහොත් IBM සහතික පත්‍ර පාඨමාලා පැවැත්වීම සඳහා මේ තාක්ෂණ ආයතනය පිළිගත් මධ්‍යස්ථානයක් සේ සලකා IBM ආයතනය ගිවිසුමකට එළැඹ ඇත.

විදේශ විශ්වවිද්‍යාල සමග ද ආයතනය පුළුල් සබඳතා ගොඩනගාගෙන ඇත. ස්වීඩනයේ උප්සාලා හා ඕස්ට්‍රේලියාවේ කර්ටින් විශ්වවිද්‍යාල ඊට නිදසුන් ය.

මෙහි තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව සාර්ථකව සම්පූර්ණ කරන සිසුන්ට ඒ සඳහා ගත කළ කාලය සැලකිල්ලට ගෙන කර්ටින් විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ උපාධියේ තෙවන වසරට කෙළින්ම ඇතුළත්වීමේ පහසුකම සලසා ඇත.

තොරතුරු තාක්ෂණ උපාධි පාඨමාලාවට ඇතුළත් කරගන්නා අවම සුදුසුකම් වන්නේ

1. උසස් පෙළ ඕනෑම විෂය ධාරාවක විෂය තුනකින් සමත්වීම

හෝ


2. ලන්ඩන් උසස් පෙළ විෂය තුනක් සමත්වීම සහ

ශ්‍රී ලංකා තො. තා. ආයතනය පවත්වන අභියෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්වීම ය.


ගාස්තු - දේශන නිබන්ධන විභාග වියදම් පරිගණක විද්‍යාගාර පහසුකම් ඇතුළත් ගාස්තුව වර්ෂයකට රු. 36,000 කි.

කොල්ලුපිටියේ මර්චන්ට් ටවර්හි පළමු මහලේ පිහිටා ඇති ලංකා බැංකුවේ 0340219554 දරණ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ ගිණුමට බැරවන පරිදි ගාස්තු මුදලින් ගෙවිය යුතු වේ.


අධ්‍යයන කටයුතුවලදී විශිෂ්ට කුසලතා දක්වන අතර යහපත් හැසිරීමෙන් යුත් සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන ගාස්තුවලින් නිදහස් කිරීම සඳහා සීමිත ශිෂ්‍යත්ව සංඛ්‍යාවක් පිරිනැමේ.



පරිගණක සේවා මධ්‍යස්ථානය



දේශනාගාරයක්



පරිගණක විද්‍යාගාරය



බහු මාධ්‍ය විද්‍යාගාරය

දක්ෂ ලෙස විෂය ග්‍රහණය කරගන්නා සිසුන්ට ලැබෙන ප්‍රතිලාභ රැසකි. එසේ තෝරාගත් ශිෂ්‍යයන්ට මෘදුකාංග සංවර්ධන කාර්ය මණ්ඩලය සමග සීමා වාසිකයන් ලෙස වැඩ කිරීමට අවස්ථාව සලසා ඇති අතර එමගින් ඔවුනට අමතර ආදායමක් ද උපයා ගත හැකි වනු ඇත. මේ ආයතනයේ පරිගණක ආචාර්යවරුන් යටතේ පහත සඳහන් හැම ක්ෂේත්‍රයකම දැනුම ඔබට ලබා ගත හැකි වේ.

ජාවා, ඔරකල්, එක්ස් එම් එල් ලෝටස් ඩොමිසෝ, ජීටොලපර් 2000 ඇක්සෙස් 2000.

ලබන වසරේ ජනවාරි මාසෙදි පශ්චාත් ඩිප්ලෝමාවක් සහ වසරේ අගභාගයේදී පශ්චාත් උපාධියක් ද ආරම්භ කිරීමට සැලසුම් කෙරේ. පශ්චාත් ඩිප්ලෝමාව සැලසුම් කරන්නේ ප්‍රධාන වශයෙන් තොරතුරු තාක්ෂණ නොවන ක්ෂේත්‍රයකින් උපාධික් ලබාගත් අයට යි.

විද්‍යාපති පශ්චාත් උපාධිය ගන්නේ පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධිය ඇති අයටයි. එහෙත් අපගේ පශ්චාත් ඩිප්ලෝමාව සමත් අයටත් ඊට ඇතුළු විය හැකියි. මෙය කෙරෙන්නේ ස්වීඩනයේ උප්සලා සරසවියත් සමග එක්වයි. ලබන වසරේදී බඳවා ගන්නා සිසුන් දැනටමත් බඳවාගෙන ලැබ ඇති අතර මේ පිළිබඳ වැඩි විස්තර ඔබට ව්‍යාපෘති අධ්‍යක්ෂ පරාක්‍රම විජේසූරිය මහතාගෙන් හෝ විමසීම් අංශයෙන් දැන ගත හැකි වේ.

දුරකථන අංක - 301904 හෝ 301905

පර්ගණක විද්‍යාගාර සහ පුස්තකාලය පරිගණක විද්‍යාගාර ශිෂ්‍ය

දක්ෂ ලෙස විෂය ග්‍රහණය කරගන්නා සිසුන්ට ලැබෙන ප්‍රතිලාභ රැසකි. එසේ තෝරාගත් ශිෂ්‍යයන්ට මෘදුකාංග සංවර්ධන කාර්ය මණ්ඩලය සමග සීමා වාසිකයන් ලෙස වැඩ කිරීමට අවස්ථාව සලසා ඇති අතර එමගින් ඔවුනට අමතර ආදායමක් ද උපයා ගත හැකි වනු ඇත.


ශිෂ්‍යාවන්ගේ හා කාර්යමණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා මතු සඳහන් පරිගණක විද්‍යාගාර ඇත.

* First year PC Laboratory of 125 computers at Malabe Campus.
*Second year PC Laboratory of 75 computers with IBM Net finity server and internet gateway.
Third year PC Laboratory of 60 Computers with IBM Net finity server and internet gateway.
* UNIX Laboratory of 30 SUN/UNIX Workstations.
*Multimedia Laboratory with 10 Multimedia Workstations
*Data Communication Laboratory with 30 Computers
Software Development Laboratory with 14 high-end computers with AS 400 Domino Server and 2 IBM Netfinity Servers.
*IBM/ACE Laboratory

සෑම පාඨමාලාවක් සඳහා ම පරිගණකයක ආධාරයෙන් කළ යුතු ප්‍රායෝගික පැවරුම් කොටසක් අන්තර්ගතව ඇත. තනි තනිව හෝ සමූහ වශයෙන් පැවරුම් කර ගෙන යාමට හැකිවන පරිදි ශිෂ්‍යයන්ට තමන්ට කැමැති පරිදි භාවිතය සඳහා පරිගණක විද්‍යාගාර පහසුකම් ලබා දෙනු ඇත. අවශ්‍ය අවස්ථාවන්හිදී ශිෂ්‍යයන්ට මග පෙන්වීමට හා සහාය දීමට විද්වත් වෘත්තික ආචාර්ය මණ්ඩලය සූදානමින් සිටී. තෙවන සහ සිව්වන වසර සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා තවත් පරිගණක විද්‍යාගාර පහසුකම් මීළඟ වසර දෙක තුළදී ඇති කිරීමට පියවර ගනු ඇත.

## පුස්තකාලය

උපාධි / ඩිප්ලෝමා පාඨමාලාව සඳහා උගන්වනු ලබන විෂය ක්ෂේත්‍රයට අදාළ මෑත දී පළකරන ලද පොත් සහ වාර ප්‍රකාශන එකතුවක් පුස්තකාලයේ ඇත. අවශ්‍ය පරිදි සිසුනට විමර්ශන කටයුතු සඳහා පුස්තකාලය පරිහරණය කළ හැකි ය. ශීඝ්‍රව වර්ධනය වන දැනුම් සම්භාරයට සරිලන පරිදි පුස්තකාලය ද අඛණ්ඩව ප්‍රවර්ධනය කරනු ලැබේ. ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ප්‍රයෝජනය සඳහා අන්තර්ජාල පහසුකම් ද සපයා ඇත. පුස්තකාලය ව්‍යාප්තවීමත් සමගම බැහැරදීමේ ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ. පොත් බැහැර ගෙන යෑම සඳහා සිසුන්ට පුස්තකාල තැන්පත් මුදලක් ගෙවීමට සිදු වේ. ❑



පර්යේෂණාගාරය

**මනෝජ් රත්නායක**

**ඡායාරූප - සිරිසේන තුඩුවගේ**